# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 243/45 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත**

අගමැතිගේ නිර්දේශය අනුව, මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග හදිසි අවස්ථා (සතුන් ගෙන යාම සීමා කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගය බලපවත්නා තාක් කල්, 1968 අංක 10 දරන පනතින් සංශෝධිත 1958 අංක 29 දරන සත්ව පනත, එහි 3අ වන වගන්තිය වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබුවාවක් මෙන් බලපැවැත්විය යුතුය :—

" වාහන සහ සතුන් රාජ්‍ය සන්තක කිරීමට අධිකරණයට ඇති බලය.

3අ. මේ කොටස යටතේ හෝ මේ කොටස යටතේ සාදන ලද නියෝග කිසිවක් යටතේ වූ වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක ඒ වරද සඳහා නියමිත වෙනත් යම් දඬුවමකට අතිරේකව, එම වරද සිදු කිරීමේදී පාවිච්චි කරනු ලැබූ යම් වාහනයක් සහ එම වරද සිදු කරන ලද්දේ යම් සතකු සම්බන්ධයෙන් ද ඒ සතාද, ඒ වරදකරු කිරීම කරන මහේස්ත්‍රාත්වරයාගේ ආඥාවකින් රාජ්‍ය සන්තක කරනු ලැබීමට යටත් වන්නේය. ''.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

105A——ජ 24289—2,100 (76/12)